පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත
மாகாணக் கல்வித் திணைக்களம் - வட மத்திய மாகாணம்
DEPARTMENT OF EDUCATION – NORTH CENTRAL PROVINCE

ශ්‍රේණිය 07

# තෙවන වාර පරීක්ෂණය - 2023

# බුද්ධ ධර්මය I,II

පාසලේ නම : ..............................................................................................

ඇතුළත්වීමේ අංකය : ..............................

කාලය පැය 02 යි.

- **සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**
- **අංක 01 සිට 10 දක්වා ප්‍රශ්නවලට වඩාත් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

01. බුදුරජාණන් වහන්සේ සියලු කෙලෙස් නැතිකර සම්මා සම්බුද්ධත්වයට පත් වූයේ,
    1. පොසොන් පෝය දිනයේ ය.
    2. ඇසල පෝය දිනයේ ය.
    3. වෙසක් පෝය දිනයේ ය.
    4. බිනර පෝය දිනයේ ය.

02. මහ සුළඟක් සමග වර්ෂාවක් ඇති වීම හා එම වර්ෂාවෙන් බුදුරජාණන් වහන්සේ ආරක්ෂා කිරීමට මුචලින්ද නා රජු ඉදිරිපත් වූයේ,
    1. පස්වන සතියේ දී ය.
    2. හයවන සතියේ දී ය.
    3. සිව්වන සතියේ දී ය.
    4. දෙවන සතියේ දී ය.

03. අනපේක්ෂිත අයුරින් තම ස්වාමියා සර්පයෙකු දෂ්ට කිරීමෙන් ද දරුවන් දෙදෙනාගෙන් එක් අයෙකු උකුස්සකු ඩැහැගෙන යාමෙන් ද, අනෙක් දරුවා දියේ ගිලීමෙන් ද මිය ගියේ ය. ඉන්පසු රහත් මෙහෙණියක් බවට පත්වූයේ,
    1. කිසා ගෝතමිය යි.
    2. රජ්ජුමාලාව යි.
    3. විශාකා සිටු දේවිය යි.
    4. පටාචාරාව යි.

04. බුදුරජාණන් වහන්සේ ගිලානෝපස්ථානයේ වටිනාකම ආදර්ශයෙන් ලොවට පෙන්නුම් කළ අවස්ථාවකට නිදසුන් ලෙස පෙන්වා දිය හැකි වන්නේ,
    1. පූතිගත්තතිස්ස තෙරුන්ට පිහිට වූ අවස්ථාව
    3. පටාචාරා තෙරණියට පිහිට වූ අවස්ථාව
    2. අංගුලිමාල තෙරුන්ට පිහිට වූ අවස්ථාව
    4. රජ්ජුමාලා තෙරණියට පිහිට වූ අවස්ථාව

05. යහපත් කොට යෙතැයි..... යන කවියෙන් ප්‍රකට වන්නේ,
    1. සුගත බුදු ගුණය යි.
    2. ලෝකවිදූ බුදු ගුණය යි.
    3. සම්මා සම්බුද්ධ බුදු ගුණය යි.
    4. අනුත්තර පුරිසධම්මසාරථී බුදු ගුණයයි

06. පන්සලේ දී අප විසින් අනුගමනය කළ යුතු සිරිතක් වශයෙන් පෙන්වා දීමට හැකි වන්නේ,
    1. පිරිසිදු නිල ඇඳුමෙන් සැරසී සිටීම.
    3. ජනෙල් පියන්පත් ඇර තැබීම.
    2. හිස් වැසුම් පාවහන් ගලවා ඇතුල් වීම.
    4. දෙගුරුන් වැඳ පිට වීම.

07. කරණීයමෙත්ත සූත්‍රයේ සඳහන් සියලු සත්ත්වයන් අතර ''මහන්තා'' යන වචනයෙන් අරුත් ගැන්වෙන්නේ,
    1. මිටි ශරීර ඇති සත්ත්වයෝ ය.
    2. මධ්‍යම ප්‍රමාණයේ ශරීර ඇති සත්ත්වයෝ ය.
    3. විශාල ශරීර ඇති සත්ත්වයෝ ය.
    4. දික් වූ ශරීර ඇති සත්ත්වයෝ ය.

08. පංචශීලයට අයත් ශික්ෂා පද අතරින් තුන්වන සිල් පදය වන්නේ,
    1. පාණාතිපාතා වේරමණී සික්ඛා පදං සමාදියාමි යන සිල් පදය යි.
    2. මුසාවාදා වේරමණී සික්ඛා පදං සමාදියාමි යන සිල් පදය යි.
    3. සුරාමේරය මජ්ජපමා දට්ඨානා වේරමණී සික්ඛා පදං සමාදියාමි යන සිල් පදය යි.
    4. කාමේසුමිච්ඡාචාරා වේරමණී සික්ඛා පදං සමාදියාමි යන සිල් පදය යි.

09. ආජීව අෂ්ඨමක සීලයට, සිල්පද කීයක් අයත් වේ ද?
    1. 5කි
    2. 6කි
    3. 8කි
    4. 9කි

10. සිගාලෝවාද සූත්‍රයට අනුව ගුරුවරයාට අයත් යුතුකමකි,
    1. අවශ්‍ය කටයුතු කර දීම
    2. හොඳින් ඉගෙනීම
    3. ලබා දෙන උපදෙස්වලට හොඳින් සවන් දීම
    4. යහළු මිත්‍රාදීන්ට හඳුන්වා දීම

(2 × 10 = 20)

• **අංක 11 සිට 15 දක්වා ප්‍රශ්න සඳහා A කොටසේ ප්‍රකාශවලට වඩාත් ගැළපෙන අදහස් දෙන ප්‍රකාශය B කොටසින් තෝරා යා කරන්න.**

| A | | B | |
|---|---|---|---|
| 11. කාව්‍යශේඛරය | I. | අයවැය සමව දැන වියදම් කිරීම | |
| 12. සමජීවිකතා | II. | ශ්‍රී මහා බෝධිය වැඩම කිරීම | |
| 13. මාතලේ අළුවිහාරය | III. | තොටගමුවේ ශ්‍රී රාහුල හිමි | |
| 14. සංඝමිත්තා තෙරණිය | IV. | ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ කිරීම | |
| 15. අමදිනවා | V. | අතුගානවා | (2 × 5 = 10) |

• **අංක 16 සිට 20 දක්වා ප්‍රකාශ නිවැරදි නම් (√) ලකුණ ද වැරදි නම් (×) ලකුණ ද වරහන තුළ යොදන්න.**

16. නිවැරදි වචන භාවිතය වාචසික සීලය යි. ( )
17. දුක්ඛ ආර්ය සත්‍ය සිගාලෝවාද සූත්‍රයේ ඇතුළත් වේ. ( )
18. හේමන්ත, ගිම්හාන, වස්සාන ඍතු අනුව ලෝකයේ හා පුද්ගල ජීවිතයේ ඇති වන වෙනස්කම් බීජ නියාම ධර්ම ලෙස හඳුන්වයි. ( )
19. කුඹුරුවලින් අස්වනු නෙලා ගැනීමෙන් පසු එහි පළමු කොටස ත්‍රිවිධ රත්නයට පූජා කිරීම **අග්‍රශෂ්‍ය** දානය නමින් හඳුන්වයි. ( )
20. ඉවසීම ඇති තැනැත්තා බොහෝ මිනිසුන්ට, දෙවියන්ට පමණක් නොව මනුෂ්‍යයන්ට ද ප්‍රිය මනාප කෙනෙක් වේ. ( ) (2 × 5 = 10)

## II කොටස

• **පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ. එම ප්‍රශ්නය සමඟ තවත් ප්‍රශ්න 04 කට පිළිතුරු සපයන්න.**

01. i. දස පින් ක්‍රියා **දෙකක්** ලියන්න.
ii. සිගාලෝවාද සූත්‍රයට අනුව ශිෂ්‍ය යුතුකම් **දෙකක්** ලියන්න.
iii. ත්‍රිවිධ චෛත්‍ය නම් කරන්න.
iv. මිහිඳු මහරහතන් වහන්සේ සමඟ ලංකාවට පැමිණි **දෙදෙනෙකු** නම් කරන්න.
v. ආර්ය අෂ්ඨාංගික මාර්ගයට අයත් අංග **දෙකක්** නම් කරන්න.
vi. බුද්ධ කාලීනව පැවති අන්තගාමී පිළිවෙත් **දෙකක්** ලියන්න.
vii. තණ්හාවේ ප්‍රභේද **දෙකක්** නම් කරන්න.
vii. ගිරිමානන්ද සූත්‍රයේ සඳහන් රෝග හටගන්නා ක්‍රම **දෙකක්** ලියන්න.
ix. සතර බ්‍රහ්ම විහරණ නම් කරන්න.
x. අපණ්ණක ජාතකයට අනුව චරිතායනය කරගත හැකි නායකත්ව ගුණාංග **දෙකක්** ලියන්න. (2 × 10 = 20)

02. i. බුදුරජාණන් වහන්සේ සත් සතිය තුළදී වැඩ සිටි ස්ථාන **දෙකක්** ලියන්න.
ii. උරුවෙල් දනව්වේ සිටි ජටිල සහෝදරයන් තිදෙනා නම් කරන්න.
iii. බුදු සිරිතෙහි පළමු විසි වසර තුළ බුද්ධ චරිතයෙන් ගත හැකි ආදර්ශ **පහක්** ලියන්න.

03. i. බුදුරජාණන් වහන්සේගේ මහා කරුණාවට ලක් වූ පුද්ගලයින් **දෙදෙනෙක්** නම් කරන්න.
ii. උපස්ථායකයෙකු තුළ තිබිය යුතු ගුණාංග **තුනක්** ලියන්න.
iii. පාසල් ශිෂ්‍යයෙකු වශයෙන් ඔබ ගිලන් වූ අයෙකුට පිහිට විය යුතු ආකාරය පැහැදිලි කරන්න.

04. i. ''අක්කොච්ඡි මං අවධි මං.....'' යන යමක වග්ගයේ තුන් වන ගාථාව සම්පූර්ණ කරන්න.
ii. එහි අර්ථය ලියන්න.
iii. ධම්ම පද ගාථා ඇසුරින් ශිෂ්‍ය ජීවිතයට ගත හැකි ආදර්ශ පාඨ **පහක්** ලියන්න.

05. i. පංච ශීලයට අයත් ශික්ෂා පද **දෙකක්** ලියන්න.
ii. විරතිය හා සමාදානය කෙටියෙන් හඳුන්වන්න
iii. පන්සිල් සුරැකීමෙන් ලබා ගත හැකි ප්‍රයෝජන **පහක්** ලියන්න

06. i. මිහිඳු මහරහතන් වහන්සේගේ ලංකාගමනය සිදු වූයේ කුමන පොහෝ දිනක ද?
ii. මහින්දාගමනයෙන් අප ලද දායාද **තුනක්** නම් කරන්න.
iii. ජාතික මෙන්ම ආගමික වශයෙන් වැදගත් බෞද්ධ සංස්කෘතිකාංග රැක ගැනීමට ඔබට කළ හැකි කාර්යයන් **පහක්** ලියන්න.

07. i. අධිපති ධර්ම **දෙකක්** ලියන්න.
ii. නුදුන් දේ ගැනීමෙන් වැළකීම යන සිල් පදයේ ත්‍රිකෝටික පාරිශුද්ධිය ඇති කර ගත යුතු අයුරු දක්වන්න.
iii. අත්තූපනායික ධම්ම පරියාය ඉගෙනීම තුළින් ශිෂ්‍යයන්ට ලබා ගත හැකි ප්‍රයෝජන පැහැදිලි කරන්න.

* * *

පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත
மாகாணக் கல்வித் திணைக்களம் - வட மத்திய மாகாணம்
DEPARTMENT OF EDUCATION – NORTH CENTRAL PROVINCE

ශ්‍රේණිය 7

# තෙවන වාර පරීක්ෂණය - 2023

විෂයය :- බුද්ධ ධර්මය

පාසලේ නම : .................................................................................................

ඇතුළත්වීමේ අංකය : ..............................

කාලය :

## පිළිතුරු පත්‍රය

| | | | |
|---|---|---|---|
| 1. 3 | 6. 2 | 11. III | 16. ✓ |
| 2. 2 | 7. 3 | 12. I | 17. x |
| 3. 4 | 8. 4 | 13. IV | 18. x |
| 4. 1 | 9. 3 | 14. II | 19. ✓ |
| 5. 1 | 10. 4 | 15. V | 20. ✓ |

## II කොටස

01. ප්‍රශ්නය
I. පෙළපොත 153 පිටුව
II. පෙළපොත 75 පිටුව
III. ශාරීරික, පාරිභෝගික, උද්දේසික
IV. ඉට්ඨිය, උත්තිය, සම්බල, භද්දසාල, සුමන සාමණේර, භණ්ඩුක, උපාසක
V. සම්මා දිට්ඨි, සම්මා සංකප්ප, සම්මා වාචා, සම්මා කම්මන්ත, සම්මා ආජීව, සම්මා වායාම, සම්මා සති, සම්මා සමාධි
VI. කාමසුඛල්ලිකානුයෝගය, අත්ථකිලමතානුයෝගය
VII. කාම, භව, විභව
VIII. 114 පිටුව
IX. මෙත්තා , කරුණා, මුදිතා, උපේක්ඛා
X. 83 පිටුව

02 ප්‍රශ්නය
I. පෙළපොතේ පිටු අංක 02
II. උරුවෙල කාශ්‍යප, නදී කාශ්‍යප , ගයා කාශ්‍යප
III. කළගුණ සැළකීම , ගුරුවරුන්ට සැළකීම යනා දී කරුණු අදාළ බවට ලකුණු දෙන්න.

03 ප්‍රශ්නය
I. පෙළපොත 2 පාඩම
II.16 පිටුව
III. පිළිතුරු බලා අදාල බවට ලකුණු දෙන්න.

04 ප්‍රශ්නය
I. අක්කොච්ජි මං අවධි මං
අජිනි මං අහාසි මේ
යේ තං උපනයිහන්ති
වේරං තේසංන සම්මති
II. අසවලා මට බැන්නේය. මට පහර දුන්නේය. මා පරාජය කළේය. මා සතු දෙය පැහැර ගත්තේය. යනුවෙන් යම් අය නැවත නැවත සිතත් නම් ඔවුන්ගේ වෛරය නොසන්සිඳේ.
III. අදාල බවට ලකුණු දෙන්න.

05 ප්‍රශ්නය
I. 58 පිටුව
II. විරතිය - අකුසලයෙන් වෙන් වීම / නොකළ යුතු දේ
සමාදාන - කුසලයෙහි නිරත වීම / කළ යුතු දේ
III. අදාල බවට ලකුණු දෙන්න.

06 ප්‍රශ්නය
I. පොසොන් පොහොය
II. 138 පිටුව බලන්න.

07 ප්‍රශ්නය
I. අත්තාධිපත්‍යය , ධම්මාධිපත්‍යය , ලෝකාධිපත්‍යය
II. සොරකමින් වැළකිය යුතුය.
අන්‍යයන් එයින් වැළැක්විය යුතුය.
සොරකමින් වැළකීමේ ගුණ වර්ණනා කළ යුතුය
III. අදාල බව බලා ලකුණු පිරිනමන්න.


LOL.lk
BookStore
විභාග ඉලක්ක
පහසුවෙන් ජයගන්න
ඕනෑම පොතක් ඉක්මනින්
නිවසටම ගෙන්වා ගන්න
| කෙටි සටහන් | පසුගිය ප්‍රශ්න පත්‍ර | වැඩ පොත් | සඟරා | O/L ප්‍රශ්න පත්‍ර
| A/L ප්‍රශ්න පත්‍ර | අනුමාන ප්‍රශ්න පත්‍ර | අතිරේක කියවීම් පොත්
| School Book | ගුරු අත්පොත්
pesuru Prakashana Private Ltd.
Akura Pilot
සමනල දැනුම
T
සතර
පෙර පාසලේ සිට උසස් පෙළ දක්වා සියළුම ප්‍රශ්න පත්‍ර,
කෙටි සටහන්, වැඩ පොත්, අතිරේක කියවීම් පොත්, සඟරා
සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ගෙදරටම ගෙන්වා ගැනීමට
www.LOL.lk වෙබ් අඩවිය වෙත යන්න